තැපැල්පති චක්‍රලේඛ අංක: 13/2026

මගේ අංකය : POST/HQ/ADM/SAS/EX/11-50/PL3/REQ(L)/2025(2026)
තැපැල් මූලස්ථානය,
කොළඹ 10.

2026.08.17

සියළුම නියෝජ්‍ය තැපැල්පතිවරුන්,

සියළුම ප්‍රාදේශීය තැපැල් අධිකාරිවරුන්/දිසා පාලන නිලධාරිවරුන්,

සියළුම ප්‍රධාන තැපැල් ස්ථානාධිපතිවරුන්/තැපැල් ස්ථානාධිපතිවරුන්,

සියළුම උප තැපැල් ස්ථානාධිපතිවරුන්,

**ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු(සීමිත) තනතුරු සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය - 2025(2026)**

**Practical Test for the Recruitment of Grade III Postal Drivers(Limited)Posts in the Primary Level Skilled Category of the Postal Department of Sri Lanka –2025(2026)**

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු තනතුරේ පුරප්පාඩු **14**ක් පිරවීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් සහායක (PPL-1-2025, PPL-2-2025, PPL-3-2025, PPL-4-2025 වැටුප් පරිමාණයේ) සහ තැපැල් සහායක කාර්මික (PL-2-2025 වැටුප් පරිමාණයේ) යන තනතුරු දරන කාර්ය මණ්ඩලයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තනතුර සඳහා තෝරාගනු ලබන්නේ බඳවාගැනීමේ පටිපාටියේ අනුමත පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි. මෙම ප්‍රායෝගික පරීක්ෂණය තැපැල් මූලස්ථානයේදී පවත්වනු ලැබේ.

**2. භාෂා මාධ්‍ය :-**

ප්‍රායෝගික පරීක්ෂණය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයකු පරීක්ෂණයට පෙනී සිටිය යුතු වන්නේ රාජ්‍ය සේවයට ඇතුළත් වූ භාෂා මාධ්‍යයෙන් පමණි.

**3. සුදුසුකම් :-**

**3.1. වෘත්තීය සුදුසුකම් :-**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ D පංතියේ (බර වාහන) රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**3.2. අධ්‍යාපන සුදුසුකම්:-** අදාල නොවේ.

**3.3. පළපුරුද්ද:-**

i. D පන්තියේ (බර වාහන) රියැදුරු බලපත්‍රයක් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.09.18) වසර 03 කට පෙර ලබා තිබිය යුතුය. (රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.)

ii. 2026.09.18 දිනට තනතුරේ ස්ථිර කරන ලද අවුරුදු පහක (05) සක්‍රීය සේවාකාලයක් සහිත හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති තැපැල් සහායක (PPL-1-2025, PPL-2-2025, PPL-3-2025, PPL-4-2025 වැටුප් පරිමාණයේ) සහ තැපැල් සහායක කාර්මික (PL -2-2025 වැටුප් පරිමාණයේ) යන තනතුරුවල අයෙකු වීම.

**3.4. කායික සුදුසුකම්:-**

i. උස අඩි 05 යි අඟල් 2 ½ කට (සෙ.මී.157) නොඅඩු විය යුතුය.

ii. සෑම අයදුම්කරුවකුම දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියදුරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.)

**3.5. වෙනත්:-**

i. පුරුෂ පාර්ශවය පමණක් අයදුම් කළ යුතුය.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනීසිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 3ඡේදයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනය වන 2026.09.18 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

**4. වයස් සීමාව:-** අදාළ නොවේ.

**5. වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025ට අනුව මාසික වැටුප් පරිමාණය රු.42,780 - 10 x 490 - 10 x 540 – 10 x 590 – 12 x 630 – රු. 66540 ක් වේ. (PL 3 -2025 අනුව)

**6. බඳවා ගැනීමේ ක්‍රමය:-**

**ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගිනි.**

ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලබන අතර සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

**සටහන :-** සීමිත බඳවාගැනීම යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව, රියදුරු III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් නොවන විට ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව විවෘත බඳවාගැනීම් යටතේ පුරවනු ලැබේ.

**6.1. ප්‍රායෝගික පරීක්ෂණය:-**

මෙම පරීක්ෂණය සඳහා පහත නිර්ණායකයන් උපයෝගි කර ගනු ලැබේ. පහත සඳහන් පරිදි ලකුණු ලබාගත යුතු අතර විෂයයන් තුනම එක වර සමත් විය යුතුය.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| I | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| II | මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| III | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

**7. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-**

i. තෝරා ගනු ලබන අයදුම්කරුවන් දැනට ස්ථිර තනතුරක් දරන අය බැවින් එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

ii. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියදුරු තනතුරේ රාජකාරි ඉටු කළ යුතුය.

**8. අයදුම්කිරීමේ ක්‍රමය:-**

i. මෙම නිවේදනයේ අවසානයට ඇති ආදර්ශ අයදුම්පතට අනුව **A4** ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහිද, ඉතිරිය 2 හා 3 පිටුවලටද, ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතුය. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලබන අතර, අයදුම්කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්පත් තැපැල් දෙපාර්තමේන්තුවේ නිල සේවා පෝටලය වන https://epay.slpost.lk/ මගින්ද ලබා ගත හැකිය.

ii. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර මෙම චක්‍රලේඛයේ 3 ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත්, ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**9. අංශභාර නිලධාරීන්ට සහ කාර්යභාර තැපැල් ස්ථානාධිපතිවරුන්ට උපදෙස් :-**

**9.1.** සියලුම අංශභාර ප්‍රධානීන් සහ කාර්යභාර තැපැල් ස්ථානාධිපතීන් විසින් මෙම නිවේදනයේ සඳහන් කරුණු තම කාර්යාලයේ/ තම පාලනය යටතේ තිබෙන උප තැපැල් කාර්යාල වල කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ අවධානයට යොමු කළ යුතුය.

**9.2.** අංශභාර ප්‍රධාන ලිපිකරු/මාණ්ඩලික සහකාර විසින් හෝ කාර්යභාර තැපැල් ස්ථානාධිපති විසින් පමණක් අයදුම්පතේ සහතිකයෙහි අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා විසින්ම සෑහීමකට පත්විය යුතුය. මේ සඳහා අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව අංශ භාර නිලධාරියා හෝ කාර්යභාර තැපැල් ස්ථානාධිපති විසින් පරීක්ෂා කර බැලිය යුතු අතර **අයදුම්පත සමඟ අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව ඉදිරිපත් නොකළ යුතුය.**

**9.3.** තමා වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් වල සඳහන් සුදුසුකම් මැනවින් පරීක්ෂා කර ඇති බවට අයදුම්පත් සහතික කරන සියලු නිලධාරීන් වගකිව යුතු අතර, මෙම චක්‍රලේඛයේ අංක 3 ඡේදයෙහි සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ඉදිරිපත් කළ යුතුය. නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය.

**9.4.** කාර්යභාර තැපැල් ස්ථානාධිපතිවරුන් විසින් සහතික කරන ලද අයදුම්පත් අදාළ ප්‍රාදේශීය තැපැල් අධිකාරී මගින්ද, අංශභාර නිලධාරීන් විසින් සහතික කරන ලද අයදුම්පත් අදාළ අංශභාර මාණ්ඩලික නිලධාරියා මගින්ද, **ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන), තැපැල් මූලස්ථානය, අංක 310, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10.** යන ලිපිනයට 2026.09.18 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපැල් මූලස්ථානය වෙත අයදුම්පත් එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු (සීමිත) තනතුරු සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය - 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**10.** ප්‍රතිඵල:-

තැපැල්පති අනුමැතිය මත ප්‍රායෝගික පරීක්ෂණයෙන් තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඔවුන් වෙත දන්වනු ලැබේ.

**11.** ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නිවාඩු :-

තැපැල්පති විසින් අයදුම්පත් පිළිගෙන ඇති අයදුම්කරුවන්ට මෙම පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ඔවුන්ගේ අංශ ප්‍රධානීන් හෝ කාර්යභාර තැපැල් ස්ථානාධිපති විසින් හෝ නිවාඩු ලබා දිය යුතු අතර එම නිවාඩු රාජකාරි නිවාඩු වශයෙන් සැලකිය යුතුය. ගමන් ගාස්තු හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

**12.** සාවද්‍ය තොරතුරු සැපයීම :-

ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්වල සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත්වීමට ඉඩදෙනු නොලබන අතර අසත්‍ය හෝ වැරදි තොරතුරක් ලබා දී ඇති බව බඳවා ගැනීමෙන් පසුව හෝ සේවය කරන කාලය තුළදී අනාවරණය වුවහොත් සේවයෙන් පහ කල හැකිය.

**13.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල භාෂා මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. මෙම චක්‍රලේඛයේ විස්තර කර නැති, එහෙත් අදාළ වූ වෙනත් කරුණු වේ නම්, එය තැපැල්පතිවරයා ලෙස මාගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

15. සේවයේ අවශ්‍යතාවය මත මේ වන විට තාවකාලික පදනමින් රියදුරු රාජකාරිවල යොදවා ඇති සේවකයන් මෙම නිවේදනය අනුව ස්ථිර රියදුරු තනතුරු සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්ය වේ.

එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී.සත්කුමාර
තැපැල්පති

එස්. ආර්. ඩබ්. එම්. ආර්. පී. සත්කුමාර
තැපැල්පති

<u>පිටපත්</u>

| | | |
|---|---|---|
| I. | නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්/පාලන/සංවර්ධන) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| II. | සියළුම පළාත්බද නියෝජ්‍ය තැපැල්පතිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| III. | ප්‍රධාන ගණකාධිකාරී | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| IV. | ප්‍රධාන අභ්‍යන්තර විගණක/ප්‍රධාන ගණකාධිකාරී (මුද්දර) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| V. | පාලක (මෙහෙයුම්/විමර්ශන) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| VI. | ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන/පළාත්බද) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| VII. | පාලන ලේකම් (කාර්ය මණ්ඩල) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| VIII. | සියළුම අධ්‍යක්ෂවරුන්/අධිකාරිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| IX. | නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| X. | ප්‍රාදේශීය තැපැල් අධිකාරිවරුන්/දිසා පාලන නිලධාරිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XI. | සියළුම සහකාර අධිකාරිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XII. | සියළුම ගණකාධිකාරිවරුන්/දිසා ගණකාධිකාරිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XIII. | සහකාර අධිකාරී/ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | } දෙපාර්තමේන්තු නිල සේවා පෝටලයේ පළ කිරීම සඳහා |
| XIV. | ඉංජිනේරු (යාන්ත්‍රික/සිවිල්) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XV. | ප්‍රධාන තැපැල් ස්ථානාධිපතිවරුන්/තැපැල් ප්‍රවාහන පරීක්ෂක | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XVI. | ප්‍රධාන උපදේශකවරුන් (තැපැල් අභ්‍යාස ආයතන) | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XVII. | කාර්යභාර තැපැල් ස්ථානාධිපතිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| XVIII. | උප තැපැල් ස්ථානාධිපතිවරුන් | - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |